# පශ්චාත් සිවිල් යුධ කාලීන ඉඩම් මංකොල්ලය සහ ගැමි ජනතාවගේ අයිතිවාසිකම් උල්ලංඝනය ඃ අම්පාර දිස්ත්‍රික්කයේ පානම ප්‍රදේශය ඇසුරින්

Faculty of Social Sciences
University of Kelaniya
Sri Lanka

**ඒ.ඒ.නුවන් ප්‍රදීප් දිල්ශාන්,**

**එම්.කේ. නදීකා දමයන්ති**

**සංක්ෂේපය**

සිවිල් යුද්ධය නිමවීමෙන් පසුව මෙරට සමාජ, ආර්ථික මෙන් ම දේශපාලන ආදී සියලු ක්ෂේත්‍රවල ගැටලු මතු කිරීමට සමත්ව ඇති, නොයෙක් ප්‍රදේශවලින් වාර්තා වූ එක් ගැටලුවකි ඉඩම් මංකොල්ලය. විශේෂයෙන් ම වසර තිහක ගැටුම් පැවති ප්‍රදේශ ආශ්‍රිතව මෙම ගැටලුව වඩා තදබල ලෙසින් පැන නැගී ඇත. මෙහි දී ඉඩම් මංකොල්ලය ලෙසින් අර්ථකථනය කරනු ලබන්නේ ප්‍රාදේශීය ජනතාව විසින් පරම්පරා ගණනාවක් තිස්සේ භුක්තිවිඳි ඉඩම් සංවර්ධන හෝ වාණිජ මට්ටමේ කෘෂිකාර්මික කටයුතු සඳහා රාජ්‍ය අංශය හෝ රාජ්‍ය අංශයේ මැදිහත්වීම මත පෞද්ගලික අංශය හෝ රාජ්‍ය මැදිහත්වීමකින් තොරව පෞද්ගලික අංශය විසින් හෝ නීත්‍යනුකූල නොවන මට්ටමකින් අත්පත්කර ගැනීමයි. මෙම අධ්‍යයනයේ අරමුණ වන්නේ ආරක්ෂක අංශ විසින් අම්පාර දිස්ත්‍රික්කයේ පානම ප්‍රදේශයේ ගැමි ජනතාව භුක්තිවිඳි ඉඩම් බලහත්කාරයෙන් අත්පත්කර ගැනීම ජනතා අයිතිවාසිකම් සම්බන්ධයෙන් බලපානු ලැබුවේ කෙසේද? සහ එම ජනතාවගේ අයිතිවාසිකම් ආරක්ෂා කරදීම සඳහා මැදිහත් වූ පාර්ශව මොනවාද? යන්න අධ්‍යයනය කිරීමයි. අධ්‍යයනය සඳහා ප්‍රාථමික මෙන් ම ද්විතීයික දත්ත ද භාවිත කරන ලදී. අන්තර්ජාලයේ පලවූ ලිපි ලේඛන, විදේශීය රටවල ඉඩම් මංකොල්ලය සම්බන්ධයෙන් සිදුකර ඇති පර්යේෂණ වාර්තා ආදිය ද්විතියික දත්ත ලෙස භාවිත කරනු ලැබූ අතර ප්‍රාථමික දත්ත සපයා ගනු ලැබුවේ ප්‍රශ්නාවලි සහ කණ්ඩායම් සාකච්ඡා ඇසුරිනි. පානම ප්‍රදේශයේ ශාස්ත්‍රවෙල, උල්පස්ස, රාගම්වෙල යන ගම්මාන තුනෙහි පවුල්වලින් 25%ක් සරල සසම්භාවී ක්‍රමයට අනුව නියැදිය සඳහා තෝරා ගනු ලැබිණි. මේ අනුව සමස්ත නියැදිය පවුල් 75කි. ලබාගත් ප්‍රාථමික දත්ත සහ තොරතුරු ප්‍රතිශත, වගු, ප්‍රස්තාර ආදී සරල සංඛ්‍යානමය විධික්‍රම භාවිතයෙන් ද, ගුණාත්මක දත්ත විස්තරාත්මක ක්‍රමවේදය ඔස්සේ ද විශ්ලේෂණය කරන ලදී. අධ්‍යයනයේ මූලික සොයා ගැනීම් වන්නේ ඉඩම්මංකොල්ලය නිසා ජනතාවගේ මානව අයිතිවාසිකම් උල්ලංඝනය වී ඇති බවයි. ප්‍රතිචාරීන්ගෙන් 100% මෙය තහවුරු කළ අතර ඉඩම් මංකොල්ලය හේතුවෙන් තමන්ගේ ජීවනෝපාය මාර්ග අහිමි වූ බව ප්‍රතිචාරීන්ගෙන් 98% ද, පවුලේ ආර්ථිකයට සෘණාත්මක බලපෑම් ඇතිවූ බව 97% ද අනාවරණය කළ අතර එහි ප්‍රතිඵලයක් වශයෙන් තම දරුවන්ගේ අධ්‍යාපන කටයුතුවලට බාධා ඇති වූ බව 63% ද අනාවරණය කළහ. ප්‍රතිචාරීන්ගෙන් 100% ප්‍රකාශකරනු ලැබුවේ තම අයිතිවාසිකම් කඩවීමේ දී දේශීය රාජ්‍ය නොවන සංවිධාන සහ ප්‍රදේශයේ සිවිල් සංවිධාන එම අයිතිවාසිකම් ආරක්ෂා කර දීම වෙනුවෙන් යම් යම් ක්‍රියාමාර්ග ගනු ලැබූ බවයි.

මුඛ්‍යපද ඃ ඉඩම්මංකොල්ලය, පානම, මූලිකඅයිතිවාසිකම්, අම්පාර දිස්ත්‍රික්කය, ජීවනෝපාය

*1. දේශපාලන විද්‍යාව, ආර්ථික විද්‍යා අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව*

*2. ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, ආර්ථික විද්‍යා අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව*